# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1717/13 - 2011 අගෝස්තු 02 වැනි අඟහරුවාදා - 2011.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. - බී.10/81.

**මහා නගර සභා ආඥාපනත**

නියමය

(252 වැනි අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 2, 5 සහ 9 යන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම මේ නියමය මගින් -

(අ) අංක 329/8 සහ 1978 අගෝස්තු මස 10 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය සඳහා වූ මහා නගර සභාව සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාව සඳහා පහත දැක්වෙන නාමය සහ නිල නාමය පවරමි :-

**"කොළඹ මහා නගර සභාව";**

(ආ) කොළඹ මහා නගර සභාව, නගරාධිපතිවරයෙකු නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු සහ අනෙකුත් සභිකයන් පනස් එක් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යැයි නියම කරමි ;

(ඇ) කොළඹ මහා නගර සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය වශයෙන් 2011 නොවැම්බර් මස පළමුවන දිනය නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

08-483


1A - G 14869— 1080 (2011/08)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.